# ශිෂ්‍යත්ව පෙරහුරු
## (පළමු ප්‍රශ්න පත්‍රයට අදාළව)
## කුරුණෑගල අධ්‍යාපන කලාපය
## I පත්‍රය

- **පහත රූප තුන අතරින් වෙනසක් සහිත රූපය තෝරන්න.**

01. I. 

II. 

III. 


- **පහත වාක්‍යයේ හිස් තැන් දෙක සම්පූර්ණ කිරීම සඳහා වඩාත් ම සුදුසු වචන යුගලය තෝරන්න.**

02. අම්මා අපගේ ................................. උදෙසා නිතර අප ගැන .................................. පසු වෙයි.

I. කරුණාව/ සැනසිල්ලෙන් II. ආරක්ෂාව/විමසිල්ලෙන් III. කරුණාව/ ඉවසිල්ලෙන්

03. **එන අදහස් සිතට**

**මනරම් ව ගොනු කරනට**

**හපනෙක්ය අපහට**

**කවියා ය ඒ හැම විට**

කවියේ අදහසට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරන්න.

I. හපනෙක් වීමට හැම විටම කවි ලියන නිසා කවියා අපට හපනෙකි.

II. සිතුවිලි මනහර ලෙස ගළපා කවි ලියන කවියා අපට හැම විට හපනෙකි.

III. අපහට හැම විට කවි ලියන කවියා හපනෙකි.

04. පහත ඇති මිනුම් ඒකකවලින් තුනක් එක් කාණ්ඩයකටත් දෙකක් තවත් කාණ්ඩයකටත් වෙන් කළ හැකිය. දෙකෙන් එක් කාණ්ඩයකටවත් අයත් නොවන්නේ කුමක් ද?

**මිලි ලීටරය, මිලි මීටරය, මීටරය, ලීටරය, සෙන්ටි මීටරය, මිලිග්‍රෑමය**

I. මිලිලීටරය II. මිලිග්‍රෑමය III. මිලිමීටරය

05. පහත එක් එක් රූපයේ ඇතුළත් සෘජුකෝණ සංඛ්‍යාව අඩුවන අනුපිළිවෙළට පෙළගස්වා ඇති පිළිතුර තෝරන්න.




I. A B D C F　　II. B A C E D　　III. B A E C D

**06.** පහත සංඛ්‍යා යෙදී ඇති රටාව තේරුම්ගෙන හිස්තැනට එන සංඛ්‍යාව තෝරන්න.




I. 95　　II. 73　　III. 59

**07.**

| | | | |
|---|---|---|---|
| 0 | 1 | 0 | 2 |
| 1 | 2 | 0 | 3 |
| 2 | 0 | 4 | 3 |
| 3 | .... | 5 | 0 |

I. 3　　II. 4　　III. 5

- **0,1,2,3,8,9 යන ඉලක්කම් වෙනුවට B C D A E F යන අක්ෂර පිළිවෙළින් යොදාගෙන එකතු කිරීමේ හා අඩු කිරීමේ ගැටලු විසඳීමේ දී නිවැරදි අක්ෂර සහිත පිළිතුර තෝරන්න.**

08.

```
    A  B  C
 −  D  C  F
 ___________
  [        ]
 ===========
```

I. B D C
II. B E D
III. D C B

09.

```
    E  D  C
 + [        ]
 ___________
    F  A  C
 ===========
```

I. C C A
II. C C B
III. C C F

10. සංඛ්‍යාවක දහයස්ථානයේ ඇති ඉලක්කම එකස්ථානයේ ඇති ඉලක්කම මෙන් තුන් ගුණයකි. දහසස්ථානයේ ඇති ඉලක්කම සියයස්ථානයේ ඇති ඉලක්කම මෙන් තුන් ගුණයකි. සියයස්ථානයේ ඇති ඉලක්කම දහසස්ථානයේ ඇති ඉලක්කමෙන් තුනෙන් එකකි. එම සංඛ්‍යාව කුමක් ද?

I. 6393 II. 9362 III. 6392

- **පහත කොටුව තුළ ඇති හැඩතලවල වටිනාකම්වල එකතුව කොටුවලට පහළින් දක්වා ඇත. ඒ ඇසුරෙන් 11 සහ 12 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**



**27** **25** **38** **22**

11. හැඩතල වටිනාකම්වලට අනුව නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,

I. □ + ○ + △ = 19 II. △ + □ + △ = 18

III. △ + ○ + ○ = 20

12. හැඩතලවල වටිනාකම්වලට නොගැළපෙන ආකාරයට පෙන්වා ඇති පිළිතුර වන්නේ කුමක්ද?

I. △ + △ + △ = □ + □

II. □ + □ + □ = ○ + ○

III. △ + △ + △ = ○ + ○

13. පාසලක ළමුන් $\frac{1}{5}$ ක් රතු මල් ද ඉතිරියෙන් $\frac{1}{4}$ ක් කහ මල් ද ඉතුරු ළමුන් සියල්ල ම සුදු මල් ද රැගෙන විත් තිබිණි. සුදු මල් ගෙනා සංඛ්‍යාව 150 ක් නම් පාසලේ ළමුන් සංඛ්‍යාව කීය ද?

I. 250 II. 300 III. 200

- **පහත දක්වා ඇත්තේ 2020 වර්ෂයේ කැලැන්ඩරයක ඉරී ගොස් ඇති කොටසකි. ඒ ඇසුරෙන් 13,14 යන ප්‍රශ්නවලට පිළිතුරු තොරන්න.**

2020 January

| Fri | Sat | Sun |
|---|---|---|
| 3 | 4 | 5 |
| 10 | 11 | 12 |
| 17 | 18 | 19 |
| 24 | 25 | 26 |
| 31 | | |

14. ඉහත කැලැන්ඩරයට අනුව මෙම වර්ෂයට ඇති සෙනසුරාදා දින ගණන කොපමණ ද?

I. 51 II. 53 III. 52

15. ඉහත දින දර්ශනයට අයත් වර්ෂයට පසු වර්ෂයේ ජනවාරි 5 දිනට යෙදෙන දවස කුමක් ද?

I. බ්‍රහස්පතින්දා II. අඟහරුවාදා III. බදාදා

16. තිරස් අතට තබා ඇති බිත්ති ඔරලෝසුවක මිනිත්තු කටුව උතුරටත් පැය කටුව දකුණට කෙළින් පිහිටන වේලාවේ සිට පැය 3 ක් ගත වූ පසු ඔරලෝසුවේ කටු පිහිටා ඇත්තේ,

I. මිනිත්තු කටුව උතරටත් පැය කටුව බටහිරටත්

II. මිනිත්තු කටුව උතුරටත් පැය කටුව නැගෙනහිරටත්.

III. මිනිත්තු කටුව දකුණටත් පැය කටුව උතුරටත්.

17. හිස් කොටු දෙකට ගැළපෙන ගණිත කර්ම දෙක අනුපිළිවෙළින් තෝරන්න.

405 ☐ 9 = 9 ☐ 5

I. x , ÷ II. ÷, x III. ÷ , +

18. S ගේ බිරිඳ M වේ. S ගේ මව R වේ. M ගේ දුව P වේ. එසේ නම් R P ගේ කවු ද?

I. අම්මා II. ආච්චි III. මිණිබිරිය

19. ඉලක්කම් වෙනුවට අකුරු යොදා ඇති පහත ගණනය කිරීම් අනුව "ම" සහ "ට" අකුරු සඳහා පිළිවෙළින් යෙදෙන ඉලක්කම් මොනවා ද?

මම x මම = මටම නම් මමම x මම = මටටම වේ නම්,

I. 1, 2 II. 1, 3 III. 2,3

20. වවුලන්, තල්මසුන් හා ක්ෂීරපායින් නිවැරදිව නිරූපණය කරන රූප සටහන තෝරන්න.

I. 

II. 

III. 

21. පැ.5 මිනිත්තු 25 ක කාලයක් පැවැති ක්‍රීඩා තරගයක් ප.ව 3.15 ට අවසන් විය ඒ අනුව තරගය ආරම්භ කළ වේලාව කීය ද?

I. පෙ.ව 9.40 II. පෙ.ව 9.50 III. පෙ.ව 9.55

- **දුර දිවීමේ තරඟයක දී ක්‍රීඩකයන් සිව්දෙනෙක් එකම ස්ථානයකින් එකම වේලාවට ආරම්භ කළ තරඟයක් නිමා කළ වේලාවන් පහත ඔරලෝසු මුහුණත්වලින් දක්වා ඇත. ඒ අනුව 23 සහ 24 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.**



**කමල්** **අමල්** **විමල්** **නිමල්**

22. මෙම ක්‍රීඩකයන් සිව්දෙනා තරඟය නිමා කිරීමට ගත කළ කාලයේ ආරෝහණ අනුපිළිවෙළ අනුව පෙළ ගැස් වූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

    I. නිමල්, විමල්, කමල්, අමල්  II. නිමල්, කමල්, අමල්, විමල්

    III. කමල්, නිමල්, අමල්, විමල්

23. ක්‍රීඩකයන් හතර දෙනා පිළිබඳ අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

    I. කමල් නිමල්ට පසු තරඟය නිම කළ අතර අමල් වැඩිම වේලාවක් ගත් ක්‍රීඩකයා විය.

    II. නිමල් තරඟයේ ප්‍රථමයා වූ අතර සිව්වැන්නා වූයේ විමල්ය.

    III. තරඟය නිම කිරීමට වැඩි ම කාලයක් විමල් ගත් අතර අඩුම කාලයක් ගෙන ඇත්තේ නිමල් ය.

24. විභාගවලින් අසමත් වූවත් යහගුණ ඇති දරුවෝ ද සිටිති. එසේ නම්,

    I. විභාගවලින් අසමත්වන දරුවෝ යහගුණ ඇති දරුවෝ නොවෙති.

    II. විභාගවලින් සමත් වන සමහර දරුවෝ යහගුණ ඇති අය නොවෙති.

    III. සමහර විභාගවලින් අසමත් දරුවෝ යහගුණ ඇති දරුවෝ නොවෙති.

25.



ඉහත පෙන්වා ඇති විශාල සමපාද ත්‍රිකෝණය ඊතල මඟින් පෙන්වා ඇති ආකාරයට අතුළතට නවා සකස් කර ගත් කුඩා ත්‍රිකෝණය පෙන්වා ඇති කඩ ඉරි දිගේ කපා වෙන් කළ විට ලැබෙන කැබලි ගණන හා හැඩ පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.

I. කැබලි හතරක් ලැබෙන අතර සියලු ම කැබලි සමපාද ත්‍රිකෝණ වේ.

II. ත්‍රිකෝණාකාර හැඩ හතරක් ලැබෙන අතර ඒ සියලු ම හැඩ එකිනෙකට වෙනස් ප්‍රමාණවලින් යුක්තය.

III. ප්‍රමාණයෙන් හැඩ යුගල සමාන ත්‍රිකෝණාකාර හැඩ හතරක් ලැබේ.

26. පහත වගුවේ දැක්වෙන අයගෙන් වයසින් අඩුම තැනැත්තිය හා වයසින් වැඩිම තැනැත්තිය අනුපිළිවෙළින් තෝරන්න.

| නම | උපන් දිනය |
|---|---|
| නිමාලි | 2015.09.15 |
| අමාලි | 2014.01.10 |
| විමාලි | 2015.04.28 |
| සුමාලි | 2014.05.08 |

I. නිමාලි අමාලි  II. අමාලි, නිමාලි  III. විමාලි, සුමාලි

27. පහත කොටුව තුළ ඇති සංඛ්‍යා පිළිබඳව ඇති වැරදි ප්‍රකාශය තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| **24** | **90** | **36** | **60** | **72** |

I. කොටුව තුළ ඇති සංඛ්‍යා 5 න් එකක් පමණක් 2, 3, 4, 5, 6 යන ඉලක්කම්වලින් ඉතුරු නැති ව බෙදිය හැකි වේ.

II. කොටුව තුළ ඇති සංඛ්‍යා සියල්ල ම 2, 3, 6 යන ඉලක්කම්වලින් ඉතුරු නැති ව බෙදිය හැකිය.

III. කොටුව තුළ ඇති සංඛ්‍යා සියල්ල ම 2, 3, 4 යන ඉලක්කම්වලින් ඉතුරු නැති ව බෙදිය හැකිය.

28. මා ළඟ රුපියල් දෙකේ කාසිවලින් පමණක් කිසියම් මුදලක් තිබිණි. මම එම මුදල ළමුන් 7 දෙනෙකු අතර සමසේ බෙදා දුනිමි. බෙදා දුන් කාසි ගණන ළමුන් ගණනට සමාන විය. ඒ අනුව මා ළඟ තිබූ මුදල කීය ද?

I. රුපියල් 78  II. රුපියල් 98  III. රුපියල් 88

29. පහත ඇති මුල් රූපය කැඩපතක් තුළින් බැලූ විට පෙනෙන ආකාරය දැක්වෙන පිළිතුර තෝරන්න.



I. 

II. 

III. 

30. උත්සව අවස්ථාවක් සඳහා ආසන පිළියෙල කිරීමේ දී අංක 100 සිට 200 තෙක් අංක පිළිවෙළින් ආසනවල අංකනය කර ඇත. ඒවා අතුරෙන් 1 සහ 2 යන ඉලක්කම් එක ළඟ යෙදෙන අංක සහිත ආසන ගණන කීය ද?

I. 10  II. 11  III. 12

31. පාසල් ක්‍රිකට් තරගයක දී එක් තරග කරුවෙක් සෑම පන්දුවකට ම හයේ සහ හතරේ පහරවල් පමණක් එල්ල කරමින් පහරවල් 30 ක් තුළ ලකුණු 160 ක් ලබා ගත්තේ ය. ඒ අනුව ඔහු ලබාගත් හයේ පහරවල් ගණන කීය ද?

I. 10 II. 15 III. 20

32. ධාවන තරගයක් සඳහා 1 සිට පිළිවෙළින් අංක පැළඳ සිටි තරග කරුවන් පිරිසක් එකිනෙකාට මුහුණ ලා සමාන පරතරයක් සහිතව අංක පිළිවෙළට රවුමක් මත සිට ගන්නා ලදි. එවිට අංක 3 පැළඳ සිටි තරග කරුවාට හරි කෙළින් මුහුණ ලා සිටියේ අංක 14 පැළඳ සිටි තරග කරුවාය. ඒ අනුව,

රවුම මත සිටි මුළු තරග කරුවන් ගණන කීය ද?

I. 20 II. 22 III. 24

33. ඉලක්කම් 5 කින් යුතු සංඛ්‍යාවක ඇති ඉලක්කම්වල එකතුව 2 කි. එම සංඛ්‍යාවේ ඇති ඉලක්කම් එක්වරක් පමණක් යොදා ගනිමින් එකිනෙකට වෙනස් වූ සංඛ්‍යා කීයක් ලිවිය හැකි ද?

I. 3 II. 4 III. 5

34.




ඉහත දැක්වෙන්නේ එකම ඝනකයේ දර්ශන තුනකි. ඝනකයේ මුහුණත් 1, 2, 3, 4, 5, 6 වශයෙන් නම් කොට ඇත. ඒ අනුව 1, 2, 5 යන ඉලක්කම්වලට විරුද්ධ පැතිවල ඇති ඉලක්කම් පිළිවෙළින් ඇති පිළිතුර තෝරන්න.

I. 4, 6, 3 II. 6, 4, 3 III. 3, 4, 6

35. සෑම සංඛ්‍යා යුගලයකම එකතුව සමාන වන පරිදි 9, 26, 15, 38, 41, 24, 35 සහ 12 යන සංඛ්‍යා අට යුගල හතරකට වෙන් කරනු ලැබේ. එවිට 35 ඇතුළත් සංඛ්‍යා යුගලයේ අනෙක් සංඛ්‍යාව කීය ද?

I. 26 II. 15 III. 38

36. අවසාන ප්‍රතිඵලයට හේතුවක් සඳහන් වන වාක්‍යය කුමක් ද?

I. වගකීමෙන් මඟහැර සිටිමට ඇය නිතර උත්සාහ කළා ය.

II. සෑම විටම පොත පත කියවීම විභාගය ජය ගැනීමට ඇයට රුකුලක් විය.

III. මුහුදට යන සෑම ජල බිඳුවක් ම එයට යා නොදී රැක ගත යුතුය.

37. පාසලක සිටින පිරිමි ළමුන් ගණන 95 ට අඩුය. එහි සිටින ගැහැනු ළමුන් ගණන 95 ට වැඩිය. පාසලේ සිටින ළමුන් ගණන සෑම විටම

I. 95 ට වැඩිය  II. 95 ට අඩුය  III. 95 ත් 190 ත් අතරය

38. A  B  C 

A B C ලෙස පෙන්වා ඇත්තේ වට්ටක්කා ගෙඩි 3 කි. A ගෙඩියේ බරට වඩා B ගෙඩියේ බරත් B ගෙඩියේ බරට වඩා C ගෙඩියේ බරත් එක සමානය. ගෙඩි තුනෙහිම බර 30kg කි. ඒ අනුව ගෙඩි 3 පිළිබඳ ඇති වැරදි ප්‍රකාශය කුමක් ද?

I. A ගෙඩියේ බර C ගෙඩියේ බරෙන් $\frac{1}{3}$ කි.

II. A සහ B ගෙඩි දෙකේ බර C ගෙඩියේ බරට සාමනය.

III. A සහ C ගෙඩි දෙකේ බර A ගෙඩියේ බර මෙන් දෙගුණයකි.

39. ඔරලෝසු මුහුණතක් කැබලි තුනකට කැඩිණි. ඉන් එක් කැබැල්ලක 9, 10 , 1, 12, 11 යන ඉලක්කම් තිබිණි. තවත් කැබැල්ලක තිබූ ඉලක්කම්වල එකතුව 20 කි. ඉතුරු කැබැල්ලේ ඇති ඉලක්කම්වල එකතුව කීය ද?

I. 16  II. 15  III. 14

40. පහත රූපයේ දැක්වෙන ජාලයෙහි පළමුවන පේළියත් තුන්වන පේළියත් එකිනෙක මාරුකර, එවිට ලැබෙන ජාලයේ පළමුවන තීරයත් තුන්වන තීරයත් එකිනෙක මාරු කරණු ලැබේ. එසේ කිරීමේ දී එක් වරක් පමණක් පිහිටීම වෙනස්වන අකුරු ඇතුළත් පිළිතුර තෝරන්න.

| | | |
|---|---|---|
| අ | ක | ච |
| ප | ම | ර |
| ල | ත | ද |

I. ර ප ත ක

II. ක ප ල ර

III. ද ල ත ක